**දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ දේශීය ආදායම් දිරිගැන්වීමේ අරමුදල - 2022**

------------------------------------------------------------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ දේශීය ආදායම් දිරිගැන්වීමේ අරමුදලේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් වියදම් ගිණුම, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට අරමුදලේ මූල්‍ය  තත්ත්වය  සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා  මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ  වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදල අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ  මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 හි වගන්ති අංක 95 යටතේ අස්ථිත්වයේ කොටස් ප්‍රාග්ධනයක් නොමැති විටක මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි මුහුණතෙහි සටහන් වශයෙන් සමුච්චිත අතිරික්තය හා ඌණතාවය දැක්විය යුතු අතර ගිණුම්කරණ ප්‍රතිපත්ති හා වැරදි නිවැරදි කිරීම්වල කරනු ලබන මුළු ගැලපීම් ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනයේ එක් එක් සංරචකයේ වෙන වෙනම හෙළිදරව් කළ යුතුය. අරමුදලේ ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශය තුළ 2019 හා 2021 වර්ෂ සඳහා වූ ගැලපීම් සිදුකර තිබුණද එම රු.22,801,109 ක ගැලපීම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශ මුහුණතෙහි සමුච්චිත අරමුදලේ ආරම්භක ශේෂයට ගලපා තිබුණි. ඒ අනුව ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනයේ 2022 ජනවාරි 01 දිනට සමුච්චිත අරමුදලේ ආරම්භක ශේෂය හා මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි එදිනට ශේෂය අසමාන වන අතර 2021 සංසන්දනාත්මක තොරතුරු තීරයේද පූර්ව වර්ෂ සඳහාවූ රු.601,420 ක ගැලපීම මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ මුහුණතෙහි සිදුකර තිබීම මත ආරම්භක ශේෂ අසමානවී තිබුණි. මෙලෙස පූර්ව වර්ෂ සඳහාවූ ගැලපීම මූල්‍ය තත්ත්ව ප්‍රකාශන මුහුණතෙහි ගැලපුම් කිරීම ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූල නොවන බව නිරීක්ෂණය කෙරේ. | විගණන විමසුමෙන් පෙන්වා දී ඇති පරිදි ඉදිරි වර්ෂයෙහි මූල්‍ය ප්‍රකාශන වල මෙම තත්වය නිවැරදි කිරිමට අදාල නිලධාරීන්ට උපදෙස් දෙන ලද බව හා ඒ අනුව ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශයෙහි අවසාන ශේෂය මූල්‍ය තත්ත්ව ප්‍රකාශයට ගැලපීම ඊලඟ වසරේ සිට නිවැරදි කිරීමට කටයුතු කරනු ඇති බව | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව ගිණුම් පිළියෙල කල යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 9,060,958 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 17,670,638 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 8,609,680 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට පූර්ව වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂය තුළදී තේ සහ ගෑස් සඳහා කරන ලද වියදම පිළිවෙලින් රු. 6,372,409 ක් හා රු. 1,144,688 කින් ඉහල ගොස් තිබීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | නිලධාරීන් වෙත නිවාස ණය ලබා දීමේ අරමුණින් අරමුදල වෙත වරින්වර මහා භාණ්ඩාගාරය විසින් ලබා දී ඇති මුදල්, රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ තැන්පත් කර නිවාස ණය අරමුදලක් පිහිටුවා තිබුණු අතර 2022 දෙසැම්බර් 31 දිනට එහි සමුච්චිත ශේෂය රු.40,137,313 ක් වී තිබුණි. කෙසේ වුවද 2011 මැයි මස සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා දශකයකට අධික කාලයක් නිලධාරීන් වෙත ණය මුදල් ලබා දී නොතිබුණු අතර,සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවීමට ඇති නිවාස ණය ශේෂය රු. 5,670,837 ක මුදලක් එනම් තැන්පතු වටිනාකමින් සියයට 14 ක් පමණක් විය. ඉතිරි රු.34,466,476 ක තැන්පතු ප්‍රමාණයම ණය වශයෙන් ලබාදීමේ හැකියාව තිබියදී හා ණය මුදල් නිලධාරියාගේ වැටුපෙන් අය කරගනු ලබන පසුබිමක ණය ආපසු අය නොවීමේ අවධානම ඉතා අවම තත්ත්වයක පැවතියදී, දෙපාර්තමේන්තුව නිවාස ණය ලබා දීම සඳහා කටයුතු කර නොතිබුණි. ඒ අනුව රජයේ ඒකාබද්ධ අරමුදලෙන් දේශීය ආදායම් නිලධාරීන්ගේ සුභසාධනය සඳහා සපයන ලද අරමුදල් එම අරමුණු වෙනුවෙන් යොදවනවා වෙනුවට වර්ෂ ගණනාවක් පුරා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ රඳවා තැබීම මත බැංකුව වෙත එම අරමුදල් විකල්ප ප්‍රභවයන්ගේ ආයෝජනය කිරීම තුළින් ප්‍රතිලාභ උපයා ගැනීම සඳහා ඉඩ ලබා දී තිබුණි. | පිළිතුරු ලබාදී නොමැත. | ණය අරමුදල පිහිටුවීමේ අරමුණ ඉටුකිරීමට අවශ්‍ය පියවර ගත යුතුය. |
| (ආ) | උක්ත විගණන නිරීක්ෂණය 2021 විගණන වාර්තාවේ ද මතු කර තිබූ අතර එයට දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් ලබා දී ඇති පිළිතුර ලෙස දැනට ලබා දී ඇති ණය මුදල සම්පූර්ණයෙන් අයවන තුරු නව ණය ලබා දිය | පිළිතුරු ලබාදී නොමැත. | ණය අරමුදල පිහිටුවීමේ අරමුණ ඉටුකිරීමට අවශ්‍ය පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | නොහැකි බවත් තැන්පතුවට ලැබෙන පොළිය ණය ලබා දීමට ප්‍රමාණවත් නොවන බවත් සඳහන් කර තිබුණි. කෙසේ වුවද, නිවාස ණය අරමුදල පිහිටුවීමේ දී බැංකුව සමඟ ඇති කරගත් ගිවිසුම ප්‍රකාරව ණය ලබා දීමට ප්‍රමාණවත් ශේෂයක් පවතින බව විගණනයට නිරීක්ෂණය විය. තවද ණය ලබා ගත් නිලධාරින්ගේ රු.5,670,837 ක ණය අය වී අවසන් වීමට වර්ෂ 8 කට අධික කාලයක් ගතවන බැවින් සියළු ණය නැවත අය වන තුරු ණය ලබා නොදීම හේතුවෙන් නිවාස ණය අරමුදල පිහිටුවීමේ අරමුණු තවදුරටත් සාක්ෂාත් නොවන බව විගණනයට නිරීක්ෂණය විය. | | |
| (ඇ) | දේශීය ආදායම් සේවයේ හා දේශීය ආදායම් දෙපාර්තමේන්තු ස්ථිර සේවයේ නිරත නිලධාරින්ට නිවසක් /ඉඩමක් මිල දී ගැනීම හෝ නිවාස අළුත්වැඩියාවක් සඳහා සියයට 5 ක පොළී අනුපාතිකයක් යටතේ පිළිවෙලින් රු.1,000,000 ක හා රු.500,000 ක උපරිමයකට යටත්ව නිවාස ණය ලබා දීමේ අරමුණෙන් පිහිටුවා තිබූ උක්ත අරමුදලේ 2022 වර්ෂයේ රු.38,977,949 ක ආරම්භක ශේෂය සඳහා ලද පොළිය රු.1,159,364 ක් වීමෙන් පොළී ප්‍රතිශතය සියයට 2.97 ක පමණ අවම අගයක් ගෙන තිබුණි. එමෙන්ම දිරිදීමනා අරමුදල සතු මුළු වත්කම් වටිනාකමින් සියයට 16 ක ප්‍රමාණයක් ණය තැන්පතු ගිණුමක රඳවා තැබීම තුළ ණය අරමුදලේ අරමුණු ඉටු නොවීම මෙන්ම ඵලදායි ආයෝජනයක යෙදවීම මඟින් දෙපාර්තමේන්තුවට ඉහල ප්‍රතිලාභ ඉපයීමේ හැකියාව ද අහිමි වී ගොස් තිබුණි. | පිළිතුරු ලබාදී නොමැත. | ණය අරමුදල පිහිටුවීමේ අරමුණ ඉටුකිරීමට අවශ්‍ය පියවර ගත යුතුය. |
| (ඇ) | 1989 අප්‍රේල් 10 දිනැතිව දේශීය ආදායම් දෙපාර්තමේන්තුව හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව විසින් අත්සන් කරන ලද ගිවිසුමෙහි ඇතුළත් ණය අනු ප්‍රමාණයන් හා බැර ශේෂය සඳහා පොළිය සම්බන්ධ කොන්දේසි වර්තමාන මූල්‍ය වෙළඳපල තත්ත්වයන් හා ණය ප්‍රතිපත්ති සමඟ සමපාත නොවීම නිසා නිවාස ණය අරමුදල සක්‍රීය නොවීම කෙරෙහි බලපා ඇති බවත් මේ හේතුවෙන් යථෝක්ත ගිවිසුම් කොන්දේසි නැවත සමාලෝචනයට භාජනය කිරීමේ අවශ්‍යතාවය කෙරෙහි දෙපාර්තමේන්තුවේ අවධානය යොමු විය යුතු බවට නිරීක්ෂණය විය. | පිළිතුරු ලබාදී නොමැත. | ණය අරමුදල පිහිටුවීමේ අරමුණ ඉටුකිරීමට අවශ්‍ය පියවර ගත යුතුය. |